## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 1965 හේ අංක 266 දරණ ආඥාව

යොමු අංකය : ජේ. 64/65සී. 59 / 3/64/118

1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උප ලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

කොළඹ, 1965 අගෝස්තු 30 වැනිදා.

### උප ලේඛනය

| I<br>ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා | II<br>ඉඩමේ විස්තරය |
| --- | --- |
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ උප දිසාපති. | කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ මහව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, උල්ලපොල පළාතේ මූනමලේගම නමැති ගමේ පිහිටි නුගගහමුලහේන්යාය (අංක 1846 දරණ අ. ග. සැ. කැබලි අංක 22 කොටසක්) නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුල පිහිටි දිගින් අඩි 173 සහ පලලින් අඩි 113 (අඩි 173×අඩි 113) ක් පමණ වූ බිම් කොටස :— |

උතුරට : ආර්. අයි. බී. යූ. බී. ඩිංගිරි බංඩා අයිතිවාසිකම් කියන නුගගහමූලහේන (1846 දරණ අ.ග.සැ. කැබැලි අංක 22 කොටසක්) ; නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : මහව-නික වැරටිය ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : ආර්. අයි. බී. යූ. බී. ඩිංගිරිබංඩා අයිතිවාසිකම් කියන නුගගහමූල හේන. (1846 දරණ අ.ග.සැ. කැබැලි අංක 22 කොටසක්).

**2. ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 32 පමණ වූ මිල්ලගහවත්ත නැමැති ඉඩම :—**

උතුරට : ඩබ්ලිව්. ඉතෙල් මාග්‍රට්, ඩබ්ලිව්. විලියම් ප්‍රනාන්දු සහ ඩබ්ලිව්. තිමෝති ප්‍රනාන්දු හිමිකම් කියන මරදකනත්ත නැමැති ඉඩම ; නැගෙනහිරට : එම ඉඩමේ ඉතුරු කොටස ; දකුණට : මොර කැලේ රජයේ පාසැල් වත්ත සහ ඇම්. එච්. ජෝෂප් ප්‍රනාන්දු, ඇම්. එච්. ජන්ගො ප්‍රනාන්දු සහ ඇම්. එච්. නෝනා ප්‍රනාන්දු හිමිකම් කියන අඹගහහේන නැමැති ඉඩම ; බස්නාහිරට : කේ. ඇස්. සෙබස්තියන් ප්‍රනාන්දු, කේ. ඇස්. මාෂල් ප්‍රනාන්දු සහ කේ. මරියා ප්‍රනාන්දු හිමිකම් කියන මරද කනත්ත නැමැති ඉඩම.

**3. ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, ප. 32 ක් පමණ වූ මරදකනත්ත නැමැති ඉඩම :—**

උතුරට : කේ. මාෂල් ප්‍රනාන්දු, කේ. ඇස්. සෙබස්තියන් ප්‍රනාන්දු සහ කේ. මරියා ප්‍රනාන්දු හිමිකම් කියන මරදකනත්ත නැමැති ඉඩම ; නැගෙනහිරට : ඇස්. එච්. සෝකීනු ප්‍රනාන්දු, ඇස්. එච්. කරලිනා ප්‍රනාන්දු, ඇස්. එච්. සිම් ප්‍රනාන්දු සහ ඇම්. එච්. විජේසේන හිමිකම් කියන මරදකනත්ත නැමැති ඉඩම ; දකුණට : ඇම්. පෙසෝනා ප්‍රනාන්දු හිමිකම් කියන මිල්ලගහවත්ත නැමැති ඉඩම ; බස්නාහිරට : කේ. ඇස්. සෙබස් තියන් ප්‍රනාන්දු, කේ. ඇස්. මාෂල් ප්‍රනාන්දු සහ කේ. මරියා ප්‍රනාන්දු හිමිකම් කියන මරද කනත්ත නැමැති ඉඩම.

**4. ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, ප. 0, ක් පමණ වූ මරදකනත්ත නැමැති ඉඩම :—**

උතුරට : ඉහල කොට්ටාරමල්ල-නාරවිල ප්‍රසිද්ධ පාර ; නැගෙනහිරට: ඇස්. එච්. සෝකීනු ප්‍රනාන්දු, ඇස්. එච්. කරලිනා ප්‍රනාන්දු, ඇස්. එච්. සිම් ප්‍රනාන්දු සහ ඇම්. එච්. විජේසේන හිමිකම් කියන මරදකනත්ත නැමැති ඉඩම ; දකුණට : ඩබ්ලිව්. ඉතෙල් මාග්‍රට්, ඩබ්ලිව්. විලියම් ප්‍රනාන්දු සහ ඩබ්ලිව්. තිමෝති ප්‍රනාන්දු හිමිකම් කියන මරදකනත්ත නැමැති ඉඩම ; බස්නාහිරට : කේ. ඇස්. සෙබස්තියන් ප්‍රනාන්දු, කේ. ඇස්. මාෂල් ප්‍රනාන්දු, සහ කේ. මරියා ප්‍රනාන්දු හිමිකම් කියන මරදකනත්ත නැමැති ඉඩම.

9–366—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශොධනය වූ පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ හිප්පොල වසමේ තලාතුඔය ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 1, රූ. 3, ප. 12 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුල වූ කරදගොල්ලවත්ත නමැති ඉඩම :—

උතුරට : උඩගෙදර වත්ත නමැති ඉඩම ;

නැගෙනහිරට : ටී. ඇන්. රාමසාමිපිල්ලෙ හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් ;

දකුණට : තලාතුඔය-කන්දහන්දිය ප්‍රසිද්ධ පාර ;

බටහිරට : පාත-හේවාහැට සමුපකාර සමිතියට අයිති ඉඩම හා බී. සී. සිල්වා හා ඩී. සී. සුබසිංහ හිමිකම් කියන ඉඩම.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ. 64/65 අයිසී 130—ඇල් ඩී/ඒ-264.

1965 අගෝස්තු මස 13 දින,
කොළඹ දීය.

9–429—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 1964 අංක 659 දරණ ආඥාව

යොමු අංකය: ජේ 63/64 ඊ 902

කපු. බී. 642

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග, හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, සවාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1964 නොවැම්බර් 17 දා.

### උපලේඛනය

| I<br>ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා | II<br>ඉඩමේ විස්තර |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ අතිරේක උප දිසාපති. | (1) කොළඹ දිස්ත්‍රික්කයේ, උතුරු අළුත්කුරු කෝරළේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, කොටුගොඩ ගමේ පිහිටි මිරිස්වත්ත නැමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර එකක් පමණ කැබැල්ල, එයට මායිම්:— |

II
ඉඩමේ විස්තරය

උතුරට: මී/කොටුගොඩ මහා විද්‍යාලය භූමිය හා මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: පියසීලි ජයවර්ධන නෝනා මහත්මිය හිමිකම් කියන අත්කර ගැනීමට යෝජිත මිරිස්වත්ත නැමැති ඉඩම; බස්නාහිරට: ජාඇල-මිනුවන්ගොඩ ප්‍රසිද්ධ පාර.

(2) කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ කොටුගොඩ ගමේ පිහිටි මිරිස්වත්ත නැමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 3 ක් පමණ කැබැල්ල, එයට මායිම්:—

උතුරට: හෙලන් ප්‍රනාන්දු නෝනා මහත්මිය හිමිකම් කියන මිරිස්වත්ත; නැගෙනහිරට හා දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස; බස්නාහිරට: ජාඇල-මිනුවන්ගොඩ ප්‍රසිද්ධ පාර.

9–248—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය: ඇල්ඒ/4131.

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධන) පණතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

නැගෙනහිර පලාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, මූතූර් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, මූතූර් මුස්ලිම් ග්‍රාමසේවක වසමේ, මූතූර් නගරයේ පිහිටි, ප්‍රමාණයෙන් අක්කර 5 ක් සහ රූඩ් 2 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළවූ, තෝලන්මේඩු නම් වූ ඉඩම:—

උතුරට: උප්පුකාච්චිමඩු නගර සභා පාර සහ මුස්ලිම් සුසාන භූමිය; දකුණට: මොහමදු මොහිදීන්ට අයිති පුද්ගලික ඉඩම (දැනට අයිතිකරු: මූතූර් හි අංක 5 දරණ කොට්ඨාශයේ ඇම්. ඒ. හමීඩ් මහතා); නැගෙනහිරට: මූතූර් හී අංක 4 දරණ කොට්ඨාශයේ පදිංචි, ඇම්. ඒ. සතක්කුලෙබ්බේ මහතාට අයිති පුද්ගලික ඉඩම; බස්නාහිරට: කයිවයික්කල්වේනෙයි නගර සභා පාර.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති.

යොමු අංකය: ජේ. 64/65 ඊ 17.
1965 ජූලි මස 28 වැනි දින, කොළඹ දී ය.

9–523—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පණතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ඇල්සී/සී 82.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

මහනුවර දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරලේ ප්‍රදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, අඹගමුව කෝරලේ, මස්කෙළිය ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්. 52, රූඩ්. 2, පර්. 10 ක්වූ ග්ලෙන්පිල්ච් වත්ත සහ ප්‍රමාණයෙන් අ. 0, රූඩ් 0, පර්. 10 ක්වූ අඩිපාර දැනට සීමා සහිත (ලංකා) මෝචා තේ සමාගම, ඒජන්තවරු, සීමාසහිත ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමගාම, 45, ක්වීන් ස්ට්‍රීට්, කොළඹ, සහ සීමාසහිත ඩිස්ට්ලරීස් අංක 29/1, 1 වැනි මහල, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1, යන අය විසින් හිමිකම් කියනු ලබන අංක පී. පී. මහ 48 දරණ සැලැස්මේ අංක 1, 2 සහ 3 වශයෙන් මැන විස්තර කර ඇති ග්ලෙන්පිල්ච් වත්ත නැමැති ඉඩම සහ අඩිපාර.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන් ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.11.29 වැනි දින පූ. භා. 10.00 ට මහනුවර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965.11.22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ල කින් දැනුම්දිය යුතුයි. තවද, මෙම ඉඩම සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද, සියලු ලියකියවිලි මේ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උප දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

1965 සැප්තැම්බර් 1 වැනි දින,
මහනුවර කච්චේරිය.

9–365—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

අංකය : කිව්.ඒ 684.

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පණතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

සැලැස්ම.—මු. සී. ඒ. 5,412.

පිහිටීම.—කළුවල් ගොඩගම, දාසියපත්තුව, අළුත්කුරු කෝරලේ බී. මාකේවිට ගම, රාගම්පත්තුව, දකුණු අළුත්කුරු කෝරළේ, කොළඹ දිස්ත්‍රික්කය.

**කැබලි අංකය : 1.**

ඉඩමේ නම : කෝන්ගහ වත්තේ දළුපොත ; විස්තර : කුඹුර, අවුරුදු 12 ක් පමණ පොල් ගස් 1, අවුරුදු 2ක් අඹ පැල 2, අවුරුදු 3 දවටගස් 3 ද වේ. ; හිමිකම් කියන්නා : ඇම්. ගුණසේකර ඩයස්, මාකේවිට, ජාඇල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 11.3.

**කැබලි අංකය : 2.**

ඉඩමේ නම : කෝන්ගහවත්ත නොහොත් කිරිමාළුවාවේ වත්ත ; විස්තර : අවුරුදු 40 ක් පමණ වූ කොස් ගස් 1, අවුරුදු 3 ක් පමණ වූ කොස්ගස් 1, අවුරුදු 3 පමණ පොල්පැල 5, අවුරුදු 12 ක් පමණ පොල්ගස් 1 ද වේ ; හිමිකම් කියන්නා : බී. දොන් ඒබ්‍රහම් කුලසේකර, මාකේවිට, ජාඇල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 06.1.

**කැබලි අංකය : 3.**

ඉඩමේ නම : කෝන්ගහවත්ත නොහොත් කිරිමාළුවාවේ වත්ත ; විස්තර : ගෙවත්ත, අවුරුදු 10 බුළුගස් 1, පොල් අතුසෙවිලි තාවකාලික ගොඩනැගිල්ලක කොටසක් ද වේ ; හිමිකම් කියන්නා : දොන් අබිලුණු අප්පුහාමි නොහොත් ඩබ්ලිව්. ඇම්. පීරිස් අප්පුහාමි, මකේවිට, ජාඇල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.0.

**කැබලි අංකය : 4.**

ඉඩමේ නම : කෝන්ගහවත්ත නොහොත් කිරිමාළුවාවේ වත්ත ; විස්තර : ගෙවත්ත, සථිර වගාවක් නැත ; හිමිකම් කියන්නා : බී. දොන් ඒබ්‍රහම් කුලසේකර, මාකේවිට, ජාඇල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 00.9.

**කැබලි අංකය : 5.**

ඉඩමේ නම : කෝන්ගහවත්ත නොහොත් කිරිමාළුවාවේ වත්ත ; විස්තරය : ගෙවත්ත, සථිර වගාවක් නැත ; හිමිකම් කියන්නා : එම්. ගුණසේකර ඩයස්, මාකේවිට, ජාඇල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 00.2.

**එකතුව : අ. 0, රූ. 0, ප. 19.5**

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ ඉඩම්වල අයිතිකම් හා වටිනාකම් ඔප්පු කිරීමට ලියවිලි ද රැගෙන 1965 ක්වූ ඔක්තෝබර් 28 වැනි දින පූ. භා. 10 ට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965ක්වූ ඔක්තෝබර් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩබ්ලිව්. ඩී. වී. මහතන්තිල,
ආණ්ඩුවේ දිසාපති,
කොළඹ දිස්ත්‍රික්කය.

1965 ක්වූ සැප්තැම්බර් මස 1 වැනි දින,
කොළඹ කච්චේරිය.

9–286—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පණතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

මගේ අංකය : ඇල්ඞී/සී 85.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, අඹගමුව කෝරළේ, මස්කෙළිය ගමේ පිහිටි, ප්‍රමාණයෙන් අක්. 13, රූඩ් 1, ප. 17 ක්වූ ග්ලෙන්ටිල්ට් වත්ත සහ ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 04 ක්වූ දිය පාර, දැනට සීමාසහිත (ලංකා) මෝචා තේ සමාගම, ඒජන්තවරු සීමාසහිත ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමාගම, 45, ක්වීන් ස්ට්‍රීට්, කොළඹ, විසින් හිමිකම් කියනු ලබන අංක පී. පී. මහ 47 දරණ සැලැස්මේ අංක 1 සහ 2 වශයෙන් මැන විස්තර කර ඇති ඉඩම්.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන් ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965. 11. 29 වැනි දින පූ. භා. 9.30 ට මහනුවර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965.11.22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. තවද, මෙම ඉඩම සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධව ද, සියලු ලියකියවිලි මේ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උප දිසාපති.

1965 සැප්තැම්බර් 1 වැනි දින,
මහනුවර කච්චේරිය.

9–318—65.9.9 දින අංක 14,501 දරන ගැස්ට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

යොමු අංකය : ඇල්ඞී/ඒ—170.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩගම් පහ කෝරලේ තෙලඹුගහවත්ත ගමේ පිහිටා ඇති ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ් 2, පර්චස් 04.5 ක් වූ දැනට අලවතුගොඩ, අටේ කණුවේ, කුරුඳුගොල්ල මුහන්දිරම්ලාගේ ගෙදර නූර් මොහමදු ලෙබ්බේගේ දුව වන පාතිමා නාචියා විසින් හිමිකම් කියනු ලබන අංක මහ. 50 දරණ මූලික පිඹුරේ කැබැලි අංක 1 වශයෙන් මැන විස්තර කරන ලද උඩුපිහිල්ලාදෙනියවත්ත නමැති ඉඩම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.10.29 වැනි දින පූ. භා. 10 ට මහනුවර දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 ඔක්තෝබර් 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද, එකී ඉඩම සම්බන්ධයෙන් හිමිකම් තහවුරු කිරීම පිණිස හා එකී ඉඩම සඳහා ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් ඇති සියලු ඔප්පු හා ලියකියවිලි මෙම විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උප දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

1965 සැප්තැම්බර් මස 2 වැනි දින,
මහනුවර කච්චේරිය.

9–421—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

මගේ අංකය: ඇල් ඞී/ඒ 99.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

මහනුවර දිස්ත්‍රික්කයේ උඩපලාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කඳුකර පහල කෝරලේ, පල්ලේදෙල්තොට ගමේ පිහිටා ඇති ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 23.8 පමණවූ ගලහා පල්ලේදෙල්තොට තැන්නේගෙදර කිරිබයියා දේවයා විසින් අයිතිවාසිකම් කියනු ලබන උඩපත්ගුවේතැන්නේ කුඹුර නැමැති අංක ඒ. 3,139 දරණ මූලික පිඹුරේ අංක 1 සහ 2 වශයෙන් මැන විස්තර කරන ලද ඉඩම් කැබලි.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.10.29 වැනි දින පූ. භා. 10.30 ට මහනුවර දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 ඔක්තෝබර් 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද, එකී ඉඩම් සම්බන්ධයෙන් හිමිකම් තහවුරු කිරීම පිණිස හා එකී ඉඩම් සඳහා ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් ඇති සියලු ඔප්පු හා ලියකියවිලි මෙම විභාගයේදී ඉදිරිපත් කල යුතුයි.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උප දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

1965 සැප්තැම්බර් 2 වැනි දින,
මහනුවර කච්චේරිය.

9–420—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශොධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත (460 වෙනි පරිච්ඡෙදය)

**7 වැනි වගන්තිය යටතේ දන්වීමයි**

සඳහන් අංකය: ඉට/1/185A-J58/59L137.

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව ඉඩම් අත්කර ගැනීමේ (460 වෙනි පරිච්ඡෙදය) ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර:—

**ප්ලෑන් අංකය:**—අංක 576 සහ 577 දරණ අවසාන ගම් සිතියමේ ඒකාබද්ධ අතිරේක අංක 1.

ඇෆ්. වී. පී. අංක 576

**කැබලි අංක 435.**

ඉඩමේ නම: අස්වැද්දුම වත්ත; ඉඩමේ විස්තර: රබර් ගස් 30 ක්ද, පොල් ගස් එකක්ද, නැදුන් ගස් 2ක්ද, දෙල් ගස් 1ක්ද, පුවක් ගස් 1ක්ද, ගොඩපර ගස් 2 ක්ද සහ අවුරුදු 10 ක් වූ පැඟිරි පඳුරු 10 ක්ද තිබෙන රබර් වත්ත; **ප්‍රමාණය: අ. 0, රූ. 0,** ප. 06.6.

**කැබැලි අංක 436.**

ඉඩමේ නම: අස්වැද්දුමවත්තෙ ඕවිට, අස්වැද්දුම වත්තෙ කුඹුර; ඉඩමේ විස්තර: අවුරුද්දක්වූ පොල් පැල 6 ක් සහ අවුරුදු 5 ක්වූ පුළුන් ගහක් තිබෙන වත්ත. අවුරුදු 10 ක්වූ පුවක් ගහක්ද, අවුරුදු 5 ක්වූ දෙඹගස් 4 ක්ද, බැම්මකින් කොටසක්ද තිබෙන කුඹුර; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 27.1.

**කැබැලි අංක 437.**

ඉඩමේ නම: අස්වැද්දුම කුඹුර; ඉඩමේ විස්තර: බැම්මකින් කොටසක් තිබෙන කුඹුර; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 33.2.

**කැබැලි අංක 438.**

ඉඩමේ නම: දෙල්ගහ පොල්ලැව; ඉඩමේ විස්තර: පොල් ගස් 17 ක්ද, අවුරුදු 15-20 ක්වූ පුවක් ගස් 4 ක්ද, අවුරුදු 5 ක්වූ රබර් ගස් 19 ක්ද, අවුරුදු 1 ක්වූ කෙසෙල් පඳුරු 6 ක්ද, බැම්මකින් කොටසක් සහ ඇලක්ද තිබෙන වත්ත; **ප්‍රමාණය:** අ. 0, රූ. 0, ප. 37.4.

**කැබැලි අංක 439.**

ඉඩමේ නම: පොල්ගහගොඩ කුඹුර; ඉඩමේ විස්තර: කුඹුර; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 00.8.

**කැබැලි අංක 440.**

ඉඩමේ නම: පොල්ගහගොඩ කුඹුර; ඉඩමේ විස්තර: කුඹුර; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 38.9.

**කැබැලි අංක 441.**

ඉඩමේ නම: පොල්ගහගොඩ වත්ත; ඉඩමේ විස්තර: පොල් ගස් 4 ක්ද, දෙල්ගස් 5 ක්ද, පුවක්ගස් 15 ක්ද, අවුරුදු 10 ක්වූ තේ පඳුරු 35 ක්ද, අවුරුදු 5 ක්වූ පුවක් පැල 18 ක්ද සහ බදාම ලිඳක්ද තිබෙන වත්ත; ප්‍රමාණය: **අ. 0, රූ. 0, ප. 07.3.**

**කැබැලි අංක 442.**

ඉඩමේ නම: පොල්ගහගොඩ පොල්ලැව; ඉඩමේ විස්තර: **කුඹුර;** ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 02.4.

**කැබැලි අංක 443.**

ඉඩමේ නම: පොල්ගහගොඩ කුඹුර; ඉඩමේ විස්තර: කුඹුර; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 09.1.

**කැබැලි අංක 444.**

ඉඩමේ නම: පොල්ගහගොඩ පොල්ලැව; ඉඩමේ විස්තර: රබර් ගස් 56 ක් ද, පැඟිරි පඳුරු 60 ක් ද සහ අවුරුදු 15 ක් වූ ගොඩපර ගස් 4 ක්ද තිබෙන කුඹුර, පැඟිරි සහ රබර් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 19.4.

**කැබැලි අංක 445.**

ඉඩමේ නම: පොල්ගහගොඩ කුඹුර; ඉඩමේ විස්තර: කුඹුර; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 12.8.

**කැබැලි අංක 446.**

ඉඩමේ නම: පොල්ගහගොඩ පොල්ලැව; ඉඩමේ විස්තර: රබර් ගස් 91 ක්ද, පැඟිරි පඳුරු 18 ක්ද, අවුරුදු 10-15 ක්වූ ගොඩපර ගස් 5 ක්ද තිබෙන පැඟිරි සහ රබර් වත්ත; ප්‍රමාණය: **අ. 0, රූ. 0,** ප. 18.1.

**කැබැලි අංක 448.**

ඉඩමේ නම : පොල්ගහගොඩ කුඹුර ; ඉඩමේ විස්තර : ඇල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.4.

**කැබැලි අංක 450.**

ඉඩමේ නම : පොල්ගහගොඩ කුඹුර ; ඉඩමේ විස්තර : ඇල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 03.6.

**එකතුව : අ. 1, රූ. 2, ප. 18.1.**

**ඇෆ්. වී. පී. අංක 577**

**කැබැලි අංක 460.**

ඉඩමේ නම : පොල්ගහගොඩ උඩුමුල්ල ; ඉඩමේ විස්තර : කුඹුර ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 05.8.

**කැබැලි අංක 461.**

ඉඩමේ නම : පොල්ගහගොඩ උඩුමුල්ල ; ඉඩමේ විස්තර : කුඹුර ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 09.7.

**කැබැලි අංක 462.**

ඉඩමේ නම : පොල්ගහගොඩ පොල්ලැව ; ඉඩමේ විස්තර : වැවිල්ලක් නැති පැඟිරි ඉඩම ; ප්‍රමාණය : ප. 0, රූ. 0, ප. 01.9.

**කැබැලි අංක 463.**

ඉඩමේ නම : පොල්ගහගොඩ උඩුමුල්ල ; ඉඩමේ විස්තර : ඇල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 02.0.

**එකතුව : අ. 0, රූ. 0, ප. 19.4.**

ඉහත සඳහන් ඉඩම් ගාළු දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලාවිටි කෝරලේ (නැගෙනහිර) උගනෝවිට සහ හත්නක යන ගම්වල පිහිටා ඇත.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වලට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටිමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1965 ඔක්තෝබර් මස 26 වෙනි දින පෙරවරු 10 ට ඇල්පිටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරී කායාීලයේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1965 ඔක්තෝබර් මස 18 වෙනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

අයිතිවාසිකම් පෙන්නුම් කිරීමට අදාලවන ඔප්පු, ලියකියවිලි ආදිය විභාගය පවත්වන වේලාවේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

තිස්ස දේවේන්ද්‍ර,
ගාළු දිස්ත්‍රික්කයේ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.

ගාළු කච්චේරිය,
1965 සැප්තැම්බර් මස 1 වෙනි ද ය.

9–422—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

අංකය : 3/64/90 / ජේ. 61/62 එල්. 149 වීඊ.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැළඩවිල්ලි හත්පත්තුවේ, කුඩාගල්බොඩ කෝරළේ, අළුපොතගම නමැති ගම, අංක 95 දරණ අවසාන ගම් සිතියමේ 1 වැනි අතිරේකය.

**කැබැලි අංක 47 :**

ඉඩමේ නම : ගෝණගමවත්ත ; විස්තරය : අවුරුදු 30 පමණ වූ පොල් ගස් 6 න් යුත් පොල්වත්ත ; අයිතිකරු : ජේ. ඩබ්ලිව්. මහකුමාරගේ මයා. 134/3, පරාක්‍රම පාර, කොළඹ 14 ; ප්‍රමාණය : අක්කර 0, රූඩ් 1, පර්චස් 03.00.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965 ඔක්තෝබර් මස 13 වැනි දින පූ. භා. 9.30 ට කුරුණෑගල කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 ඔක්තෝබර් මස 6 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සැ. යු.—අයිතිවාසිකම් ඔප්පු කිරීමට ඇති සියළුම ලියකියවිලි විභාග දිනයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඇල්. බී. උඳලාගම,
ආණ්ඩුවේ උප දිසාපති,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු මස 25 වැනි දින,
කුරුණෑගල කච්චේරිය.

9–256—65.9.9 දින අංක 61,611 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශොධිත පරිදි ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

එල්එල්/ඒ 6744

යොමු අංකය : ජේ 63/64 ඊ 671

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුල් කෝරළේ, මැද පත්තුවේ, කළවාන පිහිටි අංක 244 දරණ අවසාන ගම් සිතියමේ 2 වන අතිරේකයේ මැන විස්තර කෙරෙන පහත සඳහන් ඉඩම :—

**කැබෙලි අංකය : 421.**

ඉඩමේ නම : කෙරම්ල්ලඇලගාවාදෙනිය නොහොත් උරුළුගහ ඕකන්ද ; විස්තර : අවුරුදු 25 ක් වයස්වූ පොල්ගස් 18 ක් ඇති මුඩුබිම ; අයිතිවාසිකම් කියනුයේ : (1) කළවාන, පී. ඇම්. ජයවර්ධන මහතා, (2) කළවාන, ඩී. ඇම්. දසනායක මහතා, (3) කළවාන, ආර්. ඒ. චන්දනහාමි මහතා, (4) කළවාන ඕ. ටී. ඇම්. ඩිංගිරි බණ්ඩාර මහතා, (5) කළවාන, පී. ඩී. ඇම්. චන්ද්‍රසේකර මහතා, (6) කළවාන, ඩී. බී. කළවාන මහතා, (7) කළවාන, වයි. බී. කළවාන මහතා, (8) කළවාන, ඩබ්ලිව්. ඩිංගිරිමැණිකේ මහත්මී, (9) රත්නපුර භද්‍රා මාරපන මහතා, (10) ඇල ඩිංගිරි මැණිකේ මහත්මී ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 21.7.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965 නොවැම්බර් මස 4 වැනි දින පූ. භා. 10 ට කළවාන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යලයේදී මා සම්මුඛ විය යුතුයි

තවද, 1965 ඔක්තෝබර් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2 ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

වී. ර. බ. රාජකරුණා,
ආණ්ඩුවේ උප දිසාපති,
රත්නපුර දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු මස 31 වැනි දින,
රත්නපුර කච්චේරිය.

9–419—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460) වැනි පරිච්ඡේදය)**

**7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

යොමු අංකය : 3/61/94—ජේ 63/64 එල් 154.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, ගිරාතලාන කෝරළේ, නිකපිටිය, කොටබෙපිටිය සහ ඔතේගම නමැති ගම්:

**අංක 1,724 දරණ අ.ග.සැ. 1 වෙනි අතිරේකය—නිකපිටිය ගම.**

**කැබලි අංකය : 98.**

ඉඩමේ නම : මහවෙල; විස්තරය : කුඹුර; හිමිකම් දක්වන අය : ඇම්. ඇම්. තෝමිස් සිංඤෝ සහ ඇම්. ඇම්. ගුනතේරිස්, හිරිපොකුණ, හෙට්ටිපොල, ටී. ඇම්. රත්හාමි, අනුක්කනේ, හෙට්ටිපොල; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 24.

**කැබලි අංකය : 99.**

ඉඩමේ නම : මරකෙයාවෙල; විස්තරය : කුඹුර; හිමිකම් දක්වන අය : ඇම්. ඇම්. තෝමිස් සිංඤෝ සහ ඇම්. ඇම්. ගුනතේරිස්, හිරිපොකුණ, හෙට්ටිපොල, ටී. ඇම්. රත්හාමි, අනුක්කනේ, හෙට්ටිපොල; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 18.

**කැබලි අංකය : 100.**

ඉඩමේ නම : වාගොල්ලෙහේන; විස්තරය : හේන; හිමිකම් දක්වන අය : ඇම්. ඇම්. තෝමිස් සිංඤෝ සහ ඇම්. ඇම්. ගුනතේරිස්, හිරිපොකුණ, හෙට්ටිපොල, ටී. ඇම්. රත්හාමි, අනුක්කනේ, හෙට්ටිපොල; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 06.

**කැබලි අංකය : 101.**

ඉඩමේ නම : තුන්තොටවලගාවහේනයාය; විස්තරය : හේන; හිමිකම් දක්වන අය : ටී. ඇම්. රත්හාමි, අනුක්කනේ, හෙට්ටිපොල; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 29.

**කැබලි අංකය : 102.**

ඉඩමේ නම : තුන්තොටවලගාවහේනයාය; විස්තරය : අවුරුදු 5-10 පොල් ගස් 16ක් ඇති ඉඩම; හිමිකම් දක්වන අය : ඒ. ඇම්. පිකිරිබණ්ඩා, නිකපිටිය, හෙට්ටිපොල; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 15.

**කැබලි අංකය : 103.**

ඉඩමේ නම : තුන්තොටවලගාවහේනයාය; විස්තරය : අවුරුදු 5 පොල් ගස් 13ක් ඇති ඉඩම; හිමිකම් දක්වන අය : ජී. ඩී. බෙලේනිස්, නිකපිටිය, හෙට්ටිපොල; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 35.

**කැබලි අංකය : 104.**

ඉඩමේ නම : මහවෙල; විස්තරය : කුඹුර; හිමිකම් දක්වන අය : ඇම්. ඇම්. ගුනතේරිස්, හිරිපොකුණ, හෙට්ටිපොල,; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 38.

**කැබලි අංකය : 105.**

ඉඩමේ නම : පත්සල්වත්තෙහේන; විස්තරය : ලඳු කැලෑව; හිමිකම් දක්වන අය : ටී. ඇම්. රත්හාමි, අනුක්කනේ, හෙට්ටිපොල; ප්‍රමාණය : අ. 1, රූ. 2, ප. 02.

**කැබලි අංකය : 106.**

ඉඩමේ නම : වාගොල්ලෙහේන; විස්තරය : ලඳු කැලෑව; හිමිකම් දක්වන අය : ටී. ඇම්. රත්හාමි, අනුක්කනේ, හෙට්ටිපොල; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 12.

**කැබලි අංකය : 107.**

ඉඩමේ නම : වාගොල්ලෙහේන; විස්තරය : අත්හැර දමන ලද බැම්මක කොටසක් සහිත හේන; හිමිකම් දක්වන අය : ටී. ඇම්. රත්හාමි, අනුක්කනේ, හෙට්ටිපොල; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 16.

**කැබලි අංකය : 108.**

ඉඩමේ නම : වාගොල්ලෙහේන; විස්තරය : හේන; හිමිකම් දක්වන අය : අයිතිය රජය සතුය; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 04.

**අංක 1,713 අ.ග.සැ. 1 වෙනි අතිරේකය—කොටබෙපිටිය ගම**

**කැබලි අංකය : 98.**

ඉඩමේ නම : කෝන්ගහමුලවත්ත, කොටබෙපිටියවත්ත; විස්තරය : හේන; හිමිකම් දක්වන අය : ඇස්. ඇම්. ඒ. මරික්කාර්, කොටබෙපිටිය, හෙට්ටිපොල; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 14.

**අංක 1,725 දරණ අ.ග.සැ. 1 වෙනි අතිරේකය—ඔතේගම ගම**

**කැබලි අංකය : 75.**

ඉඩමේ නම : ඔලුකපාපුහේන, ඔතේගමහේන; විස්තරය : හේන; හිමිකම් දක්වන අය : කේ. රත්නායක, ආර්. ඇම්. මුදියන්සේ සහ ආර්. ඇම්. අප්පුහාමි, හෙට්ටිපොල; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 17.

**කැබලි අංකය : 76.**

ඉඩමේ නම : ඔලුකපාපුහේන, ඔතේගමහේන; විස්තරය : හේන; හිමිකම් දක්වන අය : කේ. රත්නායක, ආර්. ඇම්. අප්පුහාමි සහ එච්. ඇම්. කළුබණ්ඩා, හෙට්ටිපොල; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 23.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.10.29 වැනි දින පූ. භා. 9.30 ට හෙට්ටිපොල තානායමේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965.10.22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සැ. යු.—අයිතිවාසිකම් ඔප්පු කිරීමට ඇති සියළුම ලියකියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

ආර්. බී. උඳලාගම,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ උප දිසාපති.

1965 සැප්තැම්බර් මස 2 වෙනි දින,
කුරුණෑගල කච්චේරියේදීය.

9–413— 65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

මගේ අංකය : 4/2/7662.
දිසාපතිගේ අංකය : ඇල්.එච්. 4218.

**21(2) දරණ රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරණ නිවේදනයයි**

කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සීමාව තුළ කුරුදුවත්ත කොට්ඨාශයේ, මැකාර්ති පාරෙන් ඔබ්බෙහි පිහිටි අංක 11 දරණ රජයේ ඉඩම් සැලැස්මේ අංක 5 දරණ බිම් කට්ටියෙන් පර්චස් 26.23 ප්‍රමාණවූ රජයේ බිම් කැබැල්ලක්, ලංකා ගෘහිණියන්ගේ සංගමයේ භාරකරුවන් වන වී. බී. දිසානායක, ඇස්. කදිරගාමර් සහ ඒ. ආර්. ඇන්. ද පොන්සේකා යන මහතුන් විසින් එම ආයතනයේ අවශ්‍යතාවයන් සඳහා බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කරණු ලැබේ.

2. මෙම කාරණය උදෙසා ඉඩම දිය හැක. රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසි වලටද යටත් කොට එම ඉඩම් කොටස බදු දීමට යෝජනා කර ඇත:—

(අ) කාලය : අවුරුදු 99 යි.

(ආ) බද්ද : වර්ෂයකට රු. 242.63 කි.

(ඉ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුද්දක් ඇතුලත රජයේ නගර නිර්මාණ ශිල්පිදු, රජයේ වැඩ අධ්‍යක්ෂද කලින් අනුමත කරණ ලද සැලැස්මක් අනුව සහ කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තුමාගේ සිත් ගන්නා පරිද්දෙන් ලංකා ගෘහිණියන්ගේ සංගමයේ මූලස්ථානය සඳහා ගොඩනැගිල්ලක් එකී ඉඩමෙහි සාදා නිමකළ යුතුය.

(ඊ) බදු ගන්නන් විසින් මේ ඉඩම ලංකා ගෘහණියන්ගේ සංගමයේ කටයුතු පිණිස විනා අන් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි පහත දැක්වෙන දින සිට සති හයක් ඇතුලතදී මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් යථෝක්ත ඉල්ලීම පරිදි ඉඩම බදුදෙනු ලැබේ.

සී. ජේ. සේරසිංහ,
ඉඩම් කොමසාරිස්.

1965 සැප්තැම්බර් මස 9 වැනි දින,
කොළඹ, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේදීය.

9–417—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

## මාතර දිස්ත්‍රික්කයේ වල්ගම, මාතර නව ආරෝග්‍යශාලාව සඳහා රජයට අත්කර ගැනීමට යෙදුණු ඉඩමේ ස්ථිර වගාවේ පළදාව ගැනීමේ අයිතිය බදු දීම

පහත දැක්වෙන උපලේඛනයේ විස්තර වන ඉඩමේ ඇති ස්ථිර වගාවේ පළදාව ලබා ගැනීමේ අයිතිය පහත දැක්වෙන කොන්දේසි වලට යටත්ව 1965 ඔක්තෝබර් මස 4 වැනි දින සිට 1966 ඔක්තෝබර් මස 4 වැනි දින දක්වා කාලය තුළ බදු දීම සඳහා (මෙහි මින් මතු දිසාපතියැයි සඳහන් කෙරෙන) මාතර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් ටෙන්ඩර් භාරගන්නා බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### කොන්දේසි

1. ටෙන්ඩර් කැඳවනු ලබන්නේ වාර්ෂික බදු මිළ සඳහාය. වාර්ෂික බද්ද සඳහා තබන ලද ලන්සුව රුපියල් 450 කි. ඊට අඩුවෙන් ඇති ටෙන්ඩර් භාරගනු නො ලැබේ.

2. මාතර කච්චේරියෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ලියා ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍රයක් ඉල්ලුම් කර සිටින්නකු පළමු කොට මාතර කච්චේරියේ රුපියල් 10 තැන්පත් කොට එහි කුවිතාන්සිය ඉදිරිපත් කර සිටිතොත් විනා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු නො ලැබේ. ඉල්ලුම්කරු ටෙන්ඩරය ඉදිරිපත් කර ඇත්තේ ව්‍යාජ අදහසින් යැයි හෝ ඉල්ලුම්කරු නිසා ආණ්ඩුවට අනවශ්‍ය වියදම් නොහොත් අපහසුකම් සිදුවිනැයි හෝ ආණ්ඩුවේ දිසාපති විසින් සළකනු ලබතොත් විනා මෙකී තැන්පත් මුදල ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ඇත. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1965 සැප්තැම්බර් මස 27 වැනි දින උදේ 10 දක්වා නිකුත් කරනු ලැබේ. වෙන කිසිදු පෝර්මයක ලියා එවන ටෙන්ඩර් ආකෘති පත්‍ර සැළකිල්ලට ගනු නො ලැබේ.

3. "මාතර නව ආරෝග්‍යශාලාව සඳහා යෝජිත ඉඩමේ පළදාවෙහි බදු දීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් කවරයේ පිටින් ලියා සීල් තබා ඉදිරිපත් කරන ටෙන්ඩර 1965 ඔක්තෝබර් මස 4 වැනිදා දාවල් 11 දක්වා මාතර කච්චේරියේදී භාරගනු ලැබේ. ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් ආකෘති පත්‍ර මාතර කච්චේරියේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතු ය. එසේත් නොවේ නම් "දිසාපති, මාතර කච්චේරිය, මාතර" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය. ටෙන්ඩර් ආකෘති පත්‍ර මාතර කච්චේරියේදී 1965 ඔක්තෝබර් මස 4 වැනි දින දාවල් 11 වන විට විවෘත කරනු ලබන හෙයින් සියළුම ටෙන්ඩර්කරුවන්ට එ දින ඒ වේලාවට තමන්ම පැමිණ සිට හෝ තමන් වෙනුවෙන් යථා පරිදි පිළිගත් නියෝජිත යෙකු එවා හෝ තමන් සැබෑ අදහසින් ම ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති බවට දිසාපති සෑහීමකට පත් කළ යුතු යි.

4. පිළිගත් ටෙන්ඩරය ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගනු ලැබූ වහාම ඔහු විසින් ටෙන්ඩර කරන ලද මුදල සම්පූර්ණ වශයෙන් දිසාපතිට ගෙවිය යුතු යි. ඉහත දැක්වූ පරිදි ටෙන්ඩර්කරු විසින් මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් මෙම අයිතිය විකිණීම අවලංගු කිරීමටත්, එම ටෙන්ඩර්කරු විසින් ගෙවා ඇති යම් මුදලක් වෙතොත් එය රාජසන්තක කිරීමටත් දිසාපතිට පිළිවන.

5. දිසාපති තුමාට අවශ්‍ය යැයි හැඟී නියම කළහොත් පිළිගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ඇප මුදලක් තැන්පත් කළ යුතු ය. මේ මුදල කෙසේවත්, ඉල්ලුම් කරන ලද මුදලෙන් සියයට 10 කට වැඩි නො විය යුතු යි.

6. ඉල්ලුම් කරන ලද මුළු මුදල ගෙවීමෙන් සහ 5 වැනි ඡේදයේ සඳහන් මුදල තැන්පත් කිරීමෙන් ඉක්බිති වෙනත් කොන්දේසි සමග පහත සඳහන් කොන්දේසිද පිළිගත් ටෙන්ඩර්කරුට අයිතිය හිමිවනු ඇත :—

(1) ඕනෑම අවස්ථාවක මාසයක් කල් දෙමින් ලියවිල්ලක් බලපත්‍රකරුට පුද්ගලිකව භාර දීමෙන් හෝ ඔහුගේ හෝ ඇගේ හෝ අවසන් වරට දන්වන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් හෝ බදු දෙන ලද ඉඩමෙහි පැහැදිළිව පෙනෙන ස්ථානයක අලවා තැබීමෙන් හෝ මේ බද්ද එසේ කල් දෙනු ලැබූ මස අවසන අවලංගු කළ හැකි ය.

(2) ඉඩම වෙනුවෙන් ගෙවිය යුතු බදු, අයබදු, වරිපනම් ආදී සියළුම වැය මුදල් බදුකරු විසින් ගෙවිය යුතු ය.

(3) බලපත්‍රකරු තමාගේම වියදමින් ඉඩමේ සියළුම ආණ්ඩුවේ මායිම් ලකුණුද, මායිම්ද, යොදා ඒවා මනා තත්ත්වයෙන් තබා ගත යුතු යි.

(4) බලපත්‍රකරු ආණ්ඩුවේ දිසාපතිගෙන් ලියවිල්ලකින් කලින් අවසර ලබා නො ගෙන ඉඩමේ ඇති ගස් කොලන් කැපීම, ඉවත් කිරීම හෝ කවර ආකාරයකින් වුවද, ඒවාට අලාභ හානි කිරීම හෝ නො කළ යුතු යි.

(5) බලපත්‍රකරු ආණ්ඩුවේ දිසාපතිගෙන් ලියවිල්ලක් මගින් කලින් අවසර ලබා ගෙන විනා ඉඩමෙන් වැලි හෝ බොරළු ඉවත් කරගෙන නොයා යුතුයි.

(6) බලපත්‍රකරු ආණ්ඩුවේ දිසාපතිගෙන් ලියවිල්ලක් මගින් කලින් අනුමතිය ලබා නො ගෙන කිසිම තාවකාලික හෝ ස්ථිර හෝ ගොඩනැගිලි ආදියක් ඉඩමෙහි නො තැනිය යුතු ය.

(7) බලපත්‍රකරු ඉඩම් කොමසාරිස්ගෙන් ලියවිල්ලක් මගින් කලින් අනුමතිය ලබා නො ගෙන බද්ද සම්බන්ධයෙන් තමාට ඇති අයිතිවාසිකම් වෙන කෙනෙකුට පැවරීම හෝ අතුරු බදු දීම හෝ උකස් කිරීම හෝ වෙනත් අයුරකින් අත් මිදීමක් හෝ නො කළ යුතු යි.

(8) ඉඩමේ පළදාව රැක බලාගැනීමට ද, හොරුන්ගෙන්, ගින්නෙන්, හෝ වෙනත් අයුරකින් සිදුවන අලාභ හානි වළක්වා ලීමටද අවශ්‍ය විධිවිධාන බලපත්‍රකරු විසින්ම යෙදිය යුතුයි. තවද, මේ වෙනුවෙන් රජයෙන් යම් වන්දියක් ඉල්ලා සිටීමට ඔහුට අයිතිවාසිකමක් නො ලැබේ.

(9) බලපත්‍රකරු විසින් ගෙඩි කැඩීම, වගා කිරීම, ඉඩම මනා තත්ත්වයෙන් පවත්වාගෙන යාම, වල් පැළෑටි නෙලීම හා අළුතෙන් පැළ සිටුවීම යන මේවා මනා කෘෂිකාර්මික ක්‍රමයක් අනුවත්, රජයේ දිසාපති සෑහීමට පත්වන පරිදිත් කළ යුතු ය.

(10) කවර විටකදී හෝ ඉඩමට ඇතුළුවීමට ද එය පරීක්ෂා කිරීමට ද ආණ්ඩුවේ දිසාපතිට හෝ ඔහු විසින් යථා පරිදි බලය පවරනු ලැබූ නිලධාරියෙකුට බලපත්‍රකරු විසින් ඉඩ දිය යුතු යි.

(11) බද්ද අවසන් වන්නට කලින් මෙම මුළු ඉඩම හෝ ඉන් කොටසක් හෝ ආණ්ඩුවට අවශ්‍ය වී නම් ලියවිල්ලකින් මාසයක් කල් තියා දැනුම් දුන් විට බලපත්‍රකරු විසින් මුළු ඉඩම හෝ එම කොටස ආණ්ඩුවේ ඒජන්තට ආපසු භාර දිය යුතුයි. එසේ වූ විට තමා විසින් දැනටමත් ගෙවා ඇති බදු කුලියෙන් සමානුපාතික කොටසක් ආපසු ලබාගැනීමට ද බද්දෙන් ඉකුත් නොවූ කාල සීමාව වෙනුවෙන් තමා විසින් ගෙවිය යුතු බදු කුලිය සමානුපාතිකව අඩු කරවා ගැනීමට හිමිකමක් බලපත්‍රකරුට ඇත්තේ ය.

(12) බලපත්‍රකරු විසින් බද්දේ කොන්දේසි වලින් යමක් කඩ කළහොත් කිසිදු වන්දියක් නො ගෙවා ඉඩමේ භුක්තිය ආපසු ගැනීමටත් බලපත්‍රකරුගේ තැන්පත් මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ රාජසන්තක කිරීමටත් ආණ්ඩුවේ දිසාපතිට බලය ඇත්තේ ය.

(13) වැඩිදියුණු කිරීම් වෙනුවෙන් හෝ වෙනත් කිසිම කරුණක් වෙනුවෙන් හෝ ආණ්ඩුවෙන් වන්දියක් ලැබීමේ කිසිම හිමිකමක් බලපත්‍රකරුට නො ලැබෙන්නේ ය.

(14) බදු කාලය තුළ එය ආපසු පැවරීමට ඉඩ දෙනු නො ලැබේ.

7. යම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

8. මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපතිගෙන් ඉල්ලුම් කර සිටීමෙන් බද්ද හා ටෙන්ඩර් කොන්දේසි පිළිබඳ වැඩිදුර විස්තර ලබාගත හැකි ය.

ප්‍රා. සී. පීටර්ස්,
මාතර දිසාපති.

1965 සැප්තැම්බර් මස 1 දින,
මාතර දිසාපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ සහ කඩවත් සතරේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ වල්ගම පිහිටි අක්කර 29යි, රූඩ් 2, පර්. 0 පමණ වූ බිම් ප්‍රමාණයක් ඇති "කහම්පල කුරුඳු වත්ත හෙවත් නාරෝද්දේ කුරුඳුවත්ත" නමැති රජය සතු ඉඩම සහ ඊට මායිම් :—

උතුරට : ගම්සභා පාර ; නැගෙනහිරට : සරප්පුගෙවත්ත නමැති ඉඩම ; දකුණට : දෙවුන්දර ලියනගෙ මෙන්ඩිස් සිල්වා සහ තවත් අය අයිතිකම් කියන නාරෝද්දේ කුරුඳුවත්ත නමැති ඉඩම, ඩී. එල්. එම්. සිල්වා සහ තවත් අය හිමිකම් කියන ගොරකගහවත්ත නමැති ඉඩම සහ වෙලේගොඩ වල්ගම රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයත් පාර ; බටහිරට : පන්සලේ හෝ පින්දෙනිය කැලේ හෝ වෙත ඇති පාර හෝ එම මාවත.

9–371—65.9.9 දින අංක 14,501 දරන ගැසට් පත්‍රය

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති නැතට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි